
ආපදා සැලැස්ම

2026

පිදුම



නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ආපදා

දැනුම සහ තොරතුරු සොයන

සියලුම පරිශීලකයන්ට

ආපදා සැලසුම -2026/2027

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-නෙළුව

උපකාරානුස්මෘති

මග පෙන්වීම හා උපදෙස්	:	ප්‍රාදේශීය ලේකම් ආර්.එච්.එස් ප්‍රියදර්ශන මහතා
අධීක්ෂණය	:	සහකාර ප්‍රාදේශීය ලේකම් ඩී.ඒ.ඩී.මදුභාෂණී මහත්මිය
තොරතුරු ලබා ගැනීම	:	සියළුම ග්‍රාම නිලධාරීන් සියළුම වසම් භාර ප්‍රජා සංවර්ධන නිලධාරීන් කාර්යාල නිලධාරීන් ක්ෂේත්‍ර නිලධාරීන් කොට්ඨාසය තුළ ඇති රාජ්‍ය ආයතන
සංස්කරණය	:	චින්තක නලින් කුමාර සංවර්ධන නිලධාරී (ආපදා සහන සේවා) ඩබ්.කේ.බී යයෝමි සංවර්ධන නිලධාරී (ආපදා සහන සේවා)

ප්‍රාදේශීය ලේකම්තුමාගේ පණිවුඩය



ගාල්ල දිස්ත්‍රික්කයේ පරිදියේ පිහිටා ඇති දුෂ්කරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මෙය වේ. මෙම කොට්ඨාසය සිංහරාජ රක්ෂිත ලෝක උරුම වනාන්තරයට මායිමව පිහිටීමත්, වාර්ෂික වර්ෂාපතනය මි.මී 2500 -3000 අතර පැවතීමත්, ගිංගඟ හා සිංහරාජ රක්ෂිතයෙන් පෝෂණය වන ඇල දොල හා ස්වාභාවික ජල ධාරා විශාල සංඛ්‍යාවක් පැවතීමත් මෙන්ම කඳු, නිම්න වලින් ගහන භූ විෂමතාවයත් පාදක කර ගනිමින් නිරන්තරයෙන් ගංවතුර හා නායයාම් වැනි ස්වාභාවික විපත් වලට මුහණ දීමට සිදුව ඇත.

නිරිත දිග මෝසම් වර්ෂාව, අන්තර් මෝසම් වර්ෂාව හා ඇතැම් විට ඊසාන දිග මෝසම් මඟින් ඇතිවන සීඝ්‍ර වර්ෂාපතනය හේතුවෙන් සෑම වර්ෂයකම අවම වශයෙන් අවස්ථා ද්විත්වයකදී දැඩි ගංවතුර අවධානමකට මෙම කොට්ඨාසය ලක් වේ. වර්ෂ 2003 දී හා වර්ෂ 2017 දී ඇති වූ විශාල ගංවතුර ආපදාවන් මෑතකාලීන අමිහිරි අත්දැකීම් ලෙස සැලකිය හැකිය.

කොට්ඨාසයට බලපාන ලද සෑම ස්වාභාවික ආපදාවකදීම ඊට මුහුණ දී, ආපදාව සිදුවෙමින් පවතින අවස්ථාවේදීම ජීවිත බේරා ගැනීම සඳහාත්, සුරක්ෂිත මධ්‍යස්ථාන කරා ආපදාවට ලක්වූ ජනතාව යොමු කිරීමත්, ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකිරීමත්, ආපදාව පහව ගිය පසු ඔවුන් නැවත පදිංචි කිරීම හා හානි තක්සේරු කරමින් ජනතාවට සහන සැලසීමත් යන දැවැන්ත කාර්යයක නිරතවන ප්‍රාදේශීය ලේකම් ප්‍රමුඛ කාර්යය මණ්ඩලය එය සිදුකරනුයේ ආපදාවට පූර්වයෙන් සකස්කරනු ලබන වාර්ෂික ආපදා පෙර සූදානම් සැලැස්මකට අනුවය.

එවන් වැදගත්කමක් සහිත ආපදා පෙර සූදානම් සැලැස්ම 2026 වර්ෂය සඳහා සකස් කිරීම සඳහා සහයෝගය දැක්වූ සියලුම රාජ්‍ය නිලධාරීන්ට හා රාජ්‍ය නොවන ආයතනයන්ට මාගේ කෘතවේදීත්වය මෙයින් පුද කරන අතර ආපදා අවස්ථාවකදී ඊට මුහුණ දීම සඳහා මෙම අත්පොත මහඟු පිටුවහලක් වේවායි ප්‍රාර්ථනා කරමි.

ආර්.එච්.එස් ප්‍රියදර්ශන
ප්‍රාදේශීය ලේකම්
නෙළුව

පටුන

පළමු පරිච්ඡේදය 4

01. හැදින්වීම 5

1.1. ආපදා පෙර සූදානම් සැලැස්මේ ආකෘතිය 5

1.2 ප්‍රවේශය සහ ආපදාවක් යන්න හැදින්වීම. 6

.13. අරමුණු 6

1.5. දත්ත ලබාගැනීමේ ක්‍රමවේදය 7

දෙවන පරිච්ඡේදය 8

02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මූලික තොරතුරු 9

2.1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මූලික තොරතුරු. 9

2.2. නව ග්‍රාම නිලධාරී වසම් 11

2.2.1. නව ග්‍රාම නිලධාරී වසම් මායිම් 12

2.3. භෞතික තත්වය 13

2.4.1. භූ විෂමතාවය හා ජලවහනය 14

2.4.2. භූ විෂමතාවය හා ජලවහනය දැක්වෙන සිතියම 16

2.4.3. ගංගා 17

2.4.4. ගිං ගඟට වැටෙන ප්‍රධාන ඇළ මාර්ග 17

2.4.5. ඇළ/දොළ 18

2.5.1. බෑවුම් කළාප 20

2.5.2. බෑවුම් කළාප දැක්වෙන සිතියම 21

2.6.1. භූවිද්‍යාත්මක තත්වය 22

2.6.2. පාංශු තත්ත්වය 22

2.6.3. පාංශු කලාප දැක්වෙන සිතියම 23

2.7. කෘෂි පාරිසරික කළාප 24

2.8.1. වසම් අනුව ජනගහනය - (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ) 25

2.8.2. වසම් අනුව ජනගහන ප්‍රස්ථාරය 26

2.9.1. ජන ව්‍යාප්තිය (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ) 27

2.9.2. ජන ව්‍යාප්තිය ප්‍රස්ථාරය 28

2.10.1. පවුල් සංඛ්‍යාව හා නිවාස තොරතුරු (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ) 28

2.10.2. පවුල් සංඛ්‍යාව හා නිවාස තොරතුරු ප්‍රස්ථාරය 29

2.11.1. ජල සම්පාදනය පිළිබඳ තොරතුරු - (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ) 30

2.11.2. ජල සම්පාදන තොරතුරුපිළිබඳ ප්‍රස්ථාරය 31

2.12. වසම් අනුව පොදු ගොඩනැඟිලි (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ) 32

2.13. නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල් ලේඛනය 33

2.14. ආගමික ස්ථාන පිළිබඳ ලේඛනය 33

තුන්වන පරිච්ඡේදය **35**

.03පූර්ව ආපදා තොරතුරු විශ්ලේශණය 36

3.1. වර්ෂය අනුව සිදුවූ ආපදාව 36

3.2.1. ගංවතුර හා නායයෑම හේතුවෙන් අර්ධ හානි ලැබූ පවුල් සංඛ්‍යාව 39

3.2.2. 2017 වර්ෂයේ අර්ධ හානි වූ නිවාස සංඛ්‍යාව ප්‍රස්ථාරගත කිරීම 40

3.3.1. ගංවතුර හා නායයෑම හේතුවෙන් පූර්ණ හානි ලැබූ පවුල් සංඛ්‍යාව 40

3.3.2. නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූර්ණ හානි වූ පවුල් සංඛ්‍යාව ප්‍රස්ථාර ගතකිරීම 42

3.4. ගංවතුර හා නායයෑම හේතුවෙන් යටිතල පහසුකම් වලට ඇතිවූ බලපෑම 43

3.5. ගංවතුර හේතුවෙන් බලපෑමට ලක්වූ මාර්ග සහ යටවන අඩි ප්‍රමාණය 44

හතරවන පරිච්ඡේදය **49**

.04ආපදා අවස්ථාවකදී තත්ත්වයන් විශ්ලේෂණය කිරීම සහ ආපදා පෙරසූදානම සඳහා අවශ්‍ය වන තොරතුරු 50

4.1. හදිසි ආපදා අවස්ථාවකදී කාර්යාලයේ විශේෂ මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම සඳහා යොදවන නිලධාරීන් පිළිබඳ තොරතුරු 50

4.2**..1.** වසම් භාර නිලධාරීන්ගේ තොරතුරු 51

4.2.2. හදිසි ගංවතුර අවස්ථාවකදී වසමේ රාජකාරී ආවරණය කළ යුතු සංවර්ධන නිලධාරීන්ගේ සහ ග්‍රාම නිලධාරීන්ගේ නාම ලේඛණය ..... **Error! Bookmark not defined.**

4.3. හදිසි ආපදා අවස්ථාවකදී ඊට සහය දීම සඳහා පත්කල ග්‍රාමීය ක්‍රියාකාරීන් පිළිබඳ තොරතුරු 63

4.4.1.ආපදා අවධානම් කලාප 73

4.4.2. ආපදා අවදානම් ප්‍රදේශ - නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 78

4.4.3. වසම් මට්ටමින් ගංවතුර ආපදා තත්ත්වයකදී යටවන මාර්ග පද්ධතිය හා ඒ සඳහා වන විකල්ප මාර්ග පිළිබඳ තොරතුරු 80

4.4.4. මාර්ග සිතියම - නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 84

4.5. ආරක්ෂිත බිම් කඩවල් පිළිබඳ විස්තරය 85

4.6.හදිසි ආපදා අවස්ථාවකදී භාණ්ඩ හා සේවා ලබාගතහැකි වෙළඳ ආයතන පිළිබඳ විස්තරය 87

4.7.හදිසි ආපදා අවස්ථාවකදී භාවිතයට ගැනීමට හැකි ලෙස ස්ථාන ගත කර ඇති භාණ්ඩ හා පහසුකම් පිළිබඳ විස්තරය 90

4.7.1.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු 90

4.7.2.ප්‍රාදේශීය සභාව සතු 91

4.7.3. වසම් මට්ටමින් ලබාදී ඇති භාණ්ඩ 91

4.7.4. හදිසි ආපදා අවස්ථාවකදී භාණ්ඩ හා සේවා ලබාගත හැකි රාජ්‍ය හා පෞද්ගලික වෙළඳ ආයතන පිළිබඳ විස්තර 92

4.8.ආපදා අවස්ථාවකදී සම්බන්ධ කරගත යුතු සියළු ආයතන පිළිබඳ විස්තර 95

4.9.ජල බවුසර් සහ ගිලන්රථ ලබාගැනීම සම්බන්ධ තොරතුරු 96

4.10.1.දෙනියාය හා ලංකාගම ප්‍රදේශ වලව ර්ෂාව පිළිබඳ දත්ත ලබාගැනීම සඳහා දායකත්වය දක්වන පුද්ගලයන් පිළිබඳ විස්තරය 96

4.10.2.වර්ෂාමාන ස්ථානගතකර ඇති ස්ථාන දැක්වෙන සිතියම 98

4.11.1.හදිසි ආපදා තත්ත්වයකදී යාන්ත්‍රික එන්ජින් බෝට්ටු සහ අඟුල් ආපදා අවස්ථාවලදී ස්ථානගත කරන ස්ථාන 99

4.11.2.යාන්ත්‍රික එන්ජින් බෝට්ටු සහ අඟුල් ස්ථානගත කර ඇති ස්ථාන සිතියම්ගත කිරීම 100

4.12.1හදිසි ආපදා අවස්ථාවකදී හෙලිකොප්ටර් ගොඩබෑම සඳහා පහසුකම් ඇති ස්ථාන හා ඒවායේ ක්ෂේත්‍රඵල පිළිබඳ තොරතුරු 101

4.12.2. හදිසි අපදා අවස්ථාවකදී හෙලිකොප්ටර් ගොඩබෑම සඳහා පහසුකම් ඇති ස්ථාන 102

4.13.ආපදා අවස්ථාවකදී ලබාගැනීමට බලාපොරොත්තුවන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පිළිබඳ විස්තරය .. 102

4.14.හදිසි ආපදා අවස්ථාවකදී ලබාගැනීමට බලාපොරොත්තු වන අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය පිළිබඳ විස්තරය 103

4.15.කඳවුරු ස්ථානගත කිරීම පිළිබඳ තොරතුරු 104

4.15.1.කඳවුරු ස්ථානගත කිරීම - සුදර්ශනාරාමය කොස්වත්ත 104

4.15.2.කඳවුරු ස්ථානගත කිරීම - බටහිර බටුවංගල කණිටු විදුහල 105

4.15.3.කඳවුරු ස්ථානගත කිරීම - ගංගාරාම විහාරය 106

4.15.4.කඳවුරු ස්ථානගත කිරීම- කඩිහිංගල මහා විද්‍යාලය 107

4.15.5. කඳවුරු ස්ථානගත කිරීම- මාවනාන රේවථාරාමය 108

4.15.6.කඳවුරු ස්ථානගත කිරීම- ජයන්තාරාම විහාරය 109

4.15.7.කඳවුරු ස්ථානගත කිරීම- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය 110

4.15.8.කඳවුරු ස්ථානගතකිරීම සුමගසමිති ශාලාව- මාවිට නැගෙනහිර 111

4.15.9.කඳවුරු ස්ථානගත කිරීම - ධර්මපාල විහාරය 112

4.15.10. කඳවුරු ස්ථානගත කිරීම - ශ්‍රී නාථාරාමය විහාරය 113

4.15.11 කඳවුරු ස්ථානගත කිරීමට සුදුසු ස්ථාන 114

.416. ආපදා අවම කිරීම සඳහා වර්ල්ඩ්විෂන් ආයතනයේ දායකත්වය 116

.05ස්තූතිය .....



පළමු පරිච්ඡේදය.

01. හැදින්වීම

1.1. ආපදා පෙර සූදානම් සැලැස්මේ ආකෘතිය.

හැදින්වීම නැමැති පළමු පරිච්ඡේදය මගින් මෙම ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කරන ආකාරය විග්‍රහ කෙරේ.මෙම අධ්‍යනය සදහා ප්‍රවේශයක් එමගින් සැපයේ.ඒ අනුව මෙම පරිච්ඡේදය මගින් ආපදාවක් යනු කුමක්ද? සැලැස්ම සකස් කිරීමේ අරමුණු , දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය, සැලැස්ම සකස් කිරීමේ වැදගත්කම, ආපදා පෙර සූදානම් සැලැස්මේ ආකෘතිය ආදිය පිළිබඳව සාකච්ඡා කෙරේ.

දෙවන පරිච්ඡේදය මගින් කොට්ඨාශය පිළිබඳව මූලික හැදින්වීමක් සිදු කරන අතර එමගින් කොට්ඨාශයේ පිහිටීම, ග්‍රාම නිලධාරී වසම් පිළිබඳව, භෞතික තත්ත්වය, භූ විෂමතාවය හා ජල වහනය,ගංගා, ප්‍රධාන ඇල මාර්ග ,වෙනත් ඇළ/දොළ, බෑවුම් කලාප, භූ විද්‍යාත්මක තත්ත්වය, පස, කෘෂිපාරිසරික කළාප, වසම් අනුව ජනගහනය,පවුල් සංඛ්‍යාව හා නිවාස තොරතුරු,ජලසම්පාදනයපිළිබඳතොරතුරු, වසම් අනුව පොදු ගොඩනැඟිලි, කොට්ඨාසයට අයත් පාසල් ලේඛනය, ආගමික ස්ථාන පිළිබඳ ලේඛනය ආදී මූලික තොරතුරු ඇතුලත් කරමින් හා සිතියම් ඇතුලත් කරමින් සකස් කෙරේ.එමගින් කොටඨාශයේ ස්වභාවයහොදින් අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසේ.

තුන්වන පරිච්ඡේදය වෙන් වන්නේ ආපදා ඉතිහාසය පිළිබඳ තොරතුරු සපයන අතර ඒ අනුව වර්ෂය අනුව සිදුවූ ආපදාව, ගංවතුර හා නායයෑම හේතුවෙන් අර්ධ හානිලැබූ පවුල් සංඛ්‍යාව, පූර්ණ හානි ලැබූ පවුල් සංඛ්‍යාව, යටිතල පහසුකම් වලට ඇති වූ බලපෑම, ගංවතුර හේතුවෙන බලපෑමට ලක්වූ මාර්ග සහ යටවන අඩි ප්‍රමාණයඇතුලත් කරමින් සකස් කරනු ලැබේ.එමගින් ආපදා අවස්ථාවකදී යම් කරුණක් විශ්ලේෂණය කර ගැනීමට පහසු වනු ඇත.

සිව්වන පරිච්ඡේදය හෙවත් අවසන් පරිච්ඡේදය මගින් දක්වනුයේ ආපදා අවස්ථාවකදී ඉතා ඉක්මනින් අවශ්‍ය වන තොරතුරුය.එමගින් මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම සදහා යොදවන නිලධාරීන් පිළිබඳ තොරතුරු, වසම් මට්ටමින් සිටින නිලධාරී බලැනිය පිළිබඳ තොරතුරු, ග්‍රාමීය ක්‍රියාකාරීන් පිළිබඳ තොරතුරු, ආපදා අවධානම් කලාප, ගංවතුර ආපදා තත්ත්වයකදී යටවන මාර්ග පද්ධතිය හා ඒ සදහා වන විකල්ප මාර්ග පිළිබඳ තොරතුරු, ආරක්ෂිත බිම් කඩවල් පිළිබඳ තොරතුරු, ආපදා අවස්ථාවකදී භාණ්ඩ හා සේවා ලබා ගත හැකි වෙළඳ ආයතන පිළිබඳ තොරතුරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු භාණ්ඩ, ප්‍රාදේශීය සභාව සතු භාණ්ඩ, වසම් මට්ටමින් ලබා දී ඇති භාණ්ඩ, හදිසි ආපදා අවස්ථාවකදී භාණ්ඩ හා සේවා ලබා ගත හැකි රාජ්‍ය හා පොද්ගලික වෙළඳ ආයතන පිළිබඳ තොරතුරු, ආපදා අවස්ථාවකදී සම්බන්ධ කර ගත යුතු සියළු ආයතන පිළිබඳ තොරතුරු, ජල බවුසර් සහ ගිලන් රථ ලබා ගැනීම සම්බන්ධ තොරතුරු, දෙනියාය හා ලංකාගම ප්‍රදේශ වල වර්ෂාව පිළිබඳ දත්ත ලබා ගැනීම සදහා දායකත්වය දක්වන පුද්ගලයන් පිළිබඳ තොරතුරු, හදිසි ආපදා තත්ත්වයකදී යාන්ත්‍රික එන්ජින් බෝට්ටු සහ අඟුල් ආපදා අවස්ථාවලදී ස්ථානගත කරන ස්ථාන, හදිසි ආපදා අවස්ථාවකදී හෙලිකොප්ටර් ගොඩ බෑම සදහා පහසුකම් ඇති ස්ථාන හා ඒවායේ ක්ෂේත්‍ර අංක පිළිබඳ තොරතුරු, කඳවුරු ස්ථාන ගත කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් වේ. මෙම තොරතුරු සියල්ල ආපදා අවස්ථාවකදී සහන සැලසීමට හා කළමණාකරණයට අත්‍යාවශ්‍ය වේ.

1.2 ප්‍රවේශය සහ ආපදාවක් යන්න හැඳින්වීම.

A **Disaster** is a serious disruption of the functioning of a community or a society involving widespread human, material, economic or environmental losses and impacts, which exceeds the ability of the affected community or society to cope using its own resources.

(https://en.wikipedia.org/wiki/Disaster)

ආපදා සහන සේවා විධිමත් කිරීම මෙන්ම පෙර සූදානම් වීම හරහා ප්‍රජාවට සහන ලබා දීමේ නිවැරදි ක්‍රම වේදයන් හදුනා ගැනීම අත්‍යාවශ්‍යය.මෙහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මුල් කරගෙන ඇති ග්‍රාම නිලධාරී වසම් හි ජනගහණය ,භූගෝලීය පිහිටීම, ජලවහනය, ගංගා ඇලදොල වල පිහිටීම ,නිවාස වල ස්වභාවය, ප්‍රජාවන්හි ජීවන තත්ත්වය යන ආදී සියල්ලක්ම කෙරෙහි අවධානය යොමු කරමින් ආපදා අවස්ථාවකදී ජීවිත හා දේපල හානිය අවම කිරීමත් සහන සැලසීම විධිමත් කිරීමත් පාදක කොට ගෙන ආපදා පෙර සූදානම් සැලැස්මක් සකස් කිරීම අතිශයින්ම වැදගත් හා ප්‍රමුඛ කාර්යයක් වේ.

.13. අරමුණු

01.ප්‍රජාව ආපදාවකට ගොදුරු වීමට පෙර ප්‍රජාවේ ස්වභාවය හදුනාගැනීමට හැකිවීම හරහා ආපදාවකට ලක්වූ අවස්ථාවකදී සහන සේවා පහසු කර ගැනීමට හැකිවීම.

02.පෙර සූදානම හරහා ප්‍රජා මූලික සහන සේවා කඩිනම් කර ගැනීමට හැකි වීම.

03.සහන සේවාවන්හි විධිමත් භාවයක් ඇති කිරීමට හැකි වීම.

04.ආපදාවක් හේතුවෙන් ජනතාවට සිදු වන භොතික හා මානසික බිද වැටීම යතා තත්ත්වයට පත් කර ගැනීම සදහා පහසුවක් සැලසීම.

1.4. ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කිරීමේ වැදගත්කම.

මානව ඉතිහාසයේ ආරම්භයේ පටන්ම මිනිසා මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ හදිසි ආපදා අවස්ථාවන්ය. ලංකාවේද මෑතක් වන තුරුම විවිධ ආපදා අවස්ථාවන් ඇති වූවත් ඒ සදහා පෙර සූදානම් සැලැස්මක් සකස් කිරීම ආරම්භ වූයේ ඉතා මෑතකදීය.විශේෂයෙන්ම ලංකාවට 2004 වර්ෂයේ ඇති වූ සුනාමි ව්‍යසනය සමග ආපදා අවස්ථාවකදී පෙර සූදානම් සැලැස්මක් තිබීමේ අවශ්‍යතාවය ඉදිරියට පැමිණුන බව දක්නට ලැබේ. ඒ අනුව සෑම ආපදා අවස්ථාවකටම මුහුණ දීම සදහා පෙර සූදානම් සැලැස්ම සකස් කිරීම වැදගත්ය.

මෙම අවශ්‍යතාවය පෙරදැඩි කරගෙන මෙයට පෙර කොට්ඨාශයේ ආපදා පෙර සූදානම් සැලැස්මක් සකස් කර තිබුනද එහි නොයෙකුත් අඩුපාඩු දක්නට ලැබිණි.එබැවින් එම අඩුපාඩු මගහරවා ආපදා

අවස්ථාවකදී ඊට හොඳින් මුහුණ දී ජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීමටත් , ඔවුන් නැවත නගා සිටුවීමටත් මෙවැනි සැලැස්මක් සකස් කර තිබීම බෙහෙවින් වැදගත් වේ.

ඒ අනුව ගංවතුර හා නායයෑම් ආපදා බහුල නෙළුව කොට්ඨාසයේ ආපදා අවස්ථාවකදී ආපදාවට ලක් වූ ප්‍රදේශ හඳුනා ගැනීමට හා ඉක්මනින් සියල්ල සම්බන්ධීකරණය කරමින් සහන සැලසීම වෙනුවෙන් මෙම සැලැස්ම බෙහෙවින් වැදගත් වේ.

1.5. දත්ත ලබාගැනීමේ ක්‍රමවේදය.

ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත (Primary Data) සපයා ගැනීම අරඹයා ප්‍රාදේශීය ලේකම් තුමන්ගේ පූර්ණ අදහස් ලබා ගන්නා ලදී.ප්‍රාදේශීය ලේකම් තුමන් ගේ සෘජු අධීක්ෂණයට යටත්ව පහත ක්‍රම යටතේ ක්ෂේත්‍රය සම්බන්ධ දැනුමැති පුද්ගලයන්ගෙන් හා ආපදා අවස්ථාවකදී ඊට සෘජුව මැදිහත් වන නිලධාරීන් හා ප්‍රජා මූලික නායකයන්ගෙන් අවශ්‍ය ප්‍රාථමික දත්ත සපයා ගැනීමට අපේක්ෂා කෙරේ.

- ✓ සම්මුඛ සාකච්ඡා
- ✓ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා

ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය වන ද්විතීයක දත්ත (Secondary Data) සපයා ගැනීම සඳහා ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී ,කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර , ආපදා සහන සේවා නිලධාරී හා ක්ෂේත්‍රය සමග සෘජුව ගැටෙන සියළුම නිලධාරීන්ගේ පහත ක්‍රම ඔස්සේ ලිඛිත තොරතුරු හා කාර්යාලයේ පවතින ග්‍රාම නිලධාරී වසම්හි තොරතුරු සපයා ගැනේ.

- ✓ සම්මුඛ සාකච්ඡා
- ✓ පැරණි දත්ත
- ✓ සම්පත් පැතිකඩ
- ✓ එක් දින වැඩමුළු පැවැත්වීම
- ✓ ප්‍රශ්න ආකෘති පත්‍ර ලබාදීම

මෙලෙස රාශිගත කරන ලද සත්‍යභාවය මැනවින් තහවුරු කරගත් දත්ත ප්‍රාදේශීය ලේකම් තුමන්ගේ සෘජු අධීක්ෂණය යටතේ විශ්ලේෂණය කරමින් ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කෙරේ.



දෙවන පරිච්ඡේදය.

02. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මූලික තොරතුරු

2.1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මූලික තොරතුරු.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා ඊට අයත් සියළුම ග්‍රාම නිලධාරී වසම් හා ඒවායේ ස්වභාවය, සංවර්ධන තත්ත්වය, ජනගහනය , ආපදාවලට ගොදුරු වීමට ඇති අවධානම ආදිය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. එහදී ග්‍රාම නිලධාරී වසමේ භූමි ප්‍රමාණයන් ඉඩම් පරිහරණ රටාවන්, ජල මූලාශ්‍ර ආදිය පිලිබඳව තොරතුරු ලබා ගැනීම අපේක්ෂා කෙරේ.එමගින් කොට්ඨාශයේ භොතිකමය, පාලනමය, භූ ගෝලීමය, ජනගහනමය, සමාජ ආර්ථිකමය සහ යටිතල පහසුකම් වල ස්වභාවය අධ්‍යයනය කෙරේ.

2.1.1. පිහිටීම

ගාල්ල දිස්ත්‍රික්කයේ ඊසාන දිග මායිමේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටා ඇත. මෙය හිනිදුම් පත්තුව උතුර නමින්ද හැඳින්වේ.

නැගෙනහිර දේශාංශක 80 – 19 හා 89 – 29.5 අතරද

උතුරු අක්ෂාංශ 6 – 17 – 6 – 25.5 අතරද පිහිටා ඇත.

උතුරට : කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කය

නැගෙනහිරට : මාතර දිස්ත්‍රික්කය


දකුණට : මාතර දිස්ත්‍රික්කය

බටහිරට : තවලම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයයි.

හෙක්ටයාර 15384ක් විශාල වන නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වර්ග කි.මී 153 කි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 9.25% ක් නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන අතර විශාලත්වයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 18 අතුරින් 4වන ස්ථානය ගනී.

මෙම කොට්ඨාශය වයඹ ගිණිකොන දිශානුගතව විහිදේ. ප්‍රදේශයේ පිහිටීම අංක 2.1.2සිතියම මඟින් පැහැදිලි කෙරේ.

2.1.2. පිහිටීම දැක්වෙන සිතියම




2.2. නව ග්‍රාම නිලධාරි වසම්

නෙළුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 1990 දී බෙදා වෙන් වූ ග්‍රාම නිළධාරීවසම් සංඛ්‍යාව 34කි. එම වසම් සහ ඒවායේ ප්‍රමාණය හෙක්ටයාර් වලින්පහත දැක්වේ. (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ)

අනු අංකය	ග්‍රා.නි අංකය	ග්‍රා.නි වසමේ නම	බිම් ප්‍රමාණය (හෙක්ටයාර)
1	232	නෙළුව	152
2	232 ඒ	මාවිට නැගෙනහිර	344
3	233	බටුවංගල	271
4	231	මාවනාන	274
5	231ඒ	ඇඹලෙගෙදර උතුර	384
6	234බී	හප්පිටිය	703
7	234 සී	වාරුකන්දෙණිය	867
8	235	පනාගොඩ	607
9	235 බී	පන්නිමුල්ල	509
10	233බී	මද්දේගම පහළ	103
11	233 එෆ්	මද්දේගම නැගෙනහිර	207
12	233 ඩී	කොස්මුල්ල	1152
13	233 ඒ	බටුවංගල බටහිර	705
14	233සී	ඇහැලපිටිය	133
15	235 ඒ	දේවාලේගම නැගෙනහිර	306
16	238	මිල්ලව පහළ	662
17	236	මියනවතුර	271
18	237	දෙල්ලව	958
19	234 ඩී	තඹලගම	195
20	231බී	ගිඟුම්මඩුව ඉහළ	546
21	234 ඒ	ලංකාගම	1700
22	231ඩී	ගිඟුම්මඩුව පහළ	279
23	234	මාදුගැට	179
24	232ජී	කොස්වත්ත	165
25	238බී	මිල්ලව බටහිර	636
26	238ඒ	මිල්ලව ඉහළ	697
27	232සී	දනවල	527
28	232බී	ලේල්වල පහළ	144
29	232 ඊ	මාවිට බටහිර	352
30	233ඊ	මද්දේගම ඉහළ	325
31	235සී	දේවාලේගම බටහිර	322

32	232එෆ්	ලේල්වල ඉහළ	296
33	232ඩී	මැදගම	138
34	231 සී	ඇඹලෙගෙදර දකුණ	239
එකතුව			**15,348**

2.2.1. නව ග්‍රාම නිලධාරී වසම් මායිම්



2.3. භෞතික තත්වය

ගාල්ල දිස්ත්‍රික්කයේ ඊසාන දිග සීමාවේ පිහිටි නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම අනුව උතුරින් කිලෝමීටර් 120-140 හා නැගෙනහිරින් කි.මී 145-170 අතර පිහිටා තිබේ. මෙම කොට්ඨාසයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 15,348 කි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 9% ක් වන නෙළුව කොට්ඨාසයට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් විශාලත්වය අනුව සිව්වන ස්ථානය හිමි වෙයි.

මෙම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 34 අතුරින් කුඩාම ග්‍රාම නිලධාරී වසම ලෙස පහළ මද්දේගම ග්‍රාම නිලධාරී වසමත්, විශාලතම ග්‍රාම නිලධාරී වසම ලෙස ලංකගම ග්‍රාම නිලධාරී වසමත් දැක්විය හැකිය. නෙළුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ භූ විද්‍යාත්මක තොරතුරු අනුව ප්‍රාග් ක්‍රේම්බ්‍රිය යුගයට අයත් පාෂාණවලින් යුක්ත වී ඇත. විශේෂයෙන් ම මෙම කොට්ඨාසයේ විජයානු ශ්‍රේණියට අයත් චානෝකයිට් හා මෙටා අවසාදිත පාෂාණයන්ගෙන් සමන්විත වී ඇත.

මෙම කොට්ඨාසයේ භූ විෂමතාවය පිළිබඳව සළකා බැලීමේ දී භූ විෂමතා කලාප 3 ක් හඳුනාගත හැකිය. එනම්,

1. තැනි බිම්

2. මධ්‍යස්ථ උසකින් යුත් රැළි බිම් සහ

3.අඩි 500 ට වඩා උස් කඳු සහිත බිම් වශයෙනි.

මෙම කොට්ඨාසයේ බිම් ප්‍රමාණයෙන් අඩි 500 ට වඩා උස් බිම් ද දක්නට ලැබේ. සාමාන්‍ය උන්නතාංශය අඩි 300 ට වඩා උසින් යුතුව මෙම කොට්ඨාසය පිහිටා ඇත. වයඹ හා ගිණිකොණ දිශානුගතිකව විහිදෙන සුවිසල් කඳු පන්තියකින් සමන්විත මෙම කොට්ඨාසයේ භූ විෂමතාවය අනුව වැඩි උන්නතාංශය සහ එහි පිහිටීමට හේතු වී ඇත්තේ සබරගමු රක්වාන කඳුකරය ආශ්‍රිතව පිහිටා තිබීමයි.

මෙම කොට්ඨාසයේ පවතින වර්ෂාපතනය ව්‍යාප්තිය අනුව ප්‍රධාන කලාප 2 ක් හඳුනාගත හැකිය. එනම්,

1. මි.මී 2500 - 3000 අතර ප්‍රදේශ සහ
2. මි.මී 3000 - 5000 අතර ප්‍රදේශ වශයෙනි.

සමස්තයක් වශයෙන් බැලීමේදී මෙම කොට්ඨාසයේ මි.ලි 3,000 ට වඩා වැඩි වර්ෂාපතනයක් ලබන, අධික උෂ්ණත්වයක් හා අධික සුළං කාල පරිච්ඡේදයක් නොමැති පහත රට තෙත් කලාපයට අයත් ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකිය.

2.4.1. භූ විෂමතාවය හා ජලවහනය

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි භූ විෂමතාවය පිළිබඳ ව සඳහන් කිරීමේ දී එය නිරිත දිග පහත් බිම් කොටසට අයත් වන බවත්,මෙම කොට්ඨාසයේ සාමාන්‍ය උන්නතාංශය මීටර් 110 ඉක්මවන බවත් පැහැදිළිය.උන්නතාංශය පිළිබඳව සළකා බැලීමේදී අඩි 300සමෝච්ච රේඛාවට ඉහළින් පිහිටි කඳුකර ප්‍රදේශයක් බවත්, මෙම කඳුවැටිය වයඹ ,ගිණිකොණ දිශානුගතව විහිදෙන බවත් පෙනී යයි. නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් වැඩිම උන්නතාංශයක පිහිටා ඇති අතර එයට හේතු වී ඇත්තේ සබරගමු කඳුකරයට දකුණින් පිහිටි රක්වාන කඳුවැටියට පහළින් පිහිටා තිබීමයි.


තව ද නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු කොටස සිංහරාජ අඩවියෙන් මායිම් වන අතර උතුරු මායිමෙහි බටහිර කොටසෙහි උන්නතාංශය මීටර් 450ඉක්මවයි .නැගෙනහිර දෙසින් දෝතලුගල කඳු වැටි ප්‍රදේශය මීටර් 757.6දක්වා ද ,පත්තිනිගල කඳු ප්‍රදේශය මීටර් 602දක්වා ද , කොලොන්තොටුව ප්‍රදේශය මීටර් 546ක උසක් ද, ලංකාගම ප්‍රදේශයේ දී මීටර් 570ඉක්මවන අතර නැගෙනහිර මායිම මීටර් 775ඉක්මවයි .දෙල්ලව ප්‍රදේශයේ උන්නතාංශය මීටර් 600ක් වන අතර , දංගල ස්ථානයේ උස මීටර් 701.1කි.

දකුණු කොටස මිල්ලව මීටර් 510 ක් වන අතර මියනවතුර ප්‍රදේශය මීටර් 579.6ක් ද, පනාගොඩ කොටසේ කළුබෝවිටියන මීටර් 732උන්නතාංශයක් ද ,කබරගල ස්ථානයේ මීටර් 519ක උන්නතාංශයක් ද පෙන්වයි. තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් මායිම් වන බටහිර කොටසේ දනවල ,ඇඹලෙගෙදර ,මාවනාන ,ගිහුම්මඩුව යන ප්‍රදේශයන්හි උන්නතාංශය මීටර් 150ක් පමණ වේ.

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අභ්‍යන්තරයේ මැණිකාවිට ප්‍රදේශය මීටර් 413.4ක් ද ,හප්පිටිය ප්‍රදේශය මීටර් 238.8ක උන්නතාංශයකින් යුක්ත වේ.

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජලවහනය සළකා බැලීමේ දී ඊසාන දෙසින් නෙළුව කොට්ඨාසයට ඇතුළුවන ගිං ගඟ රක්වාන කඳුවැටියේ ගොන්ගල කන්දෙන් ආරම්භ වේ .ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජලවහන මාර්ගයක් ලෙසට මෙම ගිං ගඟ දැක්විය හැකිය. ඊසාන දෙසින් ප්‍රදේශයට පිවිසෙන ගිං ගඟ ලංකාගම ,මාදුගැට ග්‍රාම නිලධාරී වසම්වල දකුණු මායිම ඔස්සේ බටහිරට ගලා ගොස් බටුවංගල මාදුගැට මායිම් දිගේ උතුරට ගමන් කොට මද්දේගම ,නෙළුව සහ මාවනාන උතුරු මායිම ඔස්සේ බටහිරට ගලා ගොස් හිනිදුම් පත්තුව උතුරු කොටසට)තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට (ඇතුළු වේ.තව ද කොට්ඨාසයේ උතුරින් ,නැගෙනහිරින් සහ දකුණින් අතු ගංගාවක් ද ගිං ගඟට එකතු වේ. ඒ අනුව ගිං ගඟට එකතුවන ප්‍රධාන ඇළ මාර්ග පහත පරිදි දැක්විය හැකිය.

2.4.2. භූ විෂමතාවය හා ජලවහනය දැක්වෙන සිතියම



2.4.3. ගංඟා

අනු අංකය	ගංඟාව	ගංඟාව ගලා බසින ග්‍රාම නිලධාරී වසම	ගංඟාවේ පළල(මීටර්)
1	ගිං ගඟ	ලංකාගම	20m
2	ගිං ගඟ	වාරුකන්දෙණිය,මාදුගැට,හප්පිටිය	10-20m
	ගිං ගඟ	තඹලගම,ඇහැලපිටිය,කොස්මුල්ල	15m
3	ගිං ගඟ	බටුවංගල	30m
4	ගිං ගඟ	පහළ මද්දෙම, බටහිර බටුවංගල,මාවිට නැගෙනහිර	15m
5	ගිං ගඟ	නෙළුව	30m
6	ගිං ගඟ	මාවනාන,ඇඹලේගෙදර උතුර	20m

2.4.4. ගිං ගඟට වැටෙන ප්‍රධාන ඇළ මාර්ග

අනු අංකය	ඇළ මාර්ගය	එකතුවන මාර්ගය
1	මිල්ලව ඇළ	මෙය ගිං ගඟට එකතු නොවන අතර, මිල්ලව ප්‍රදේශය හරහා ගිණිකොණ දෙසට ගලා ගොස් නිල්වලා ගඟට එකතු වේ.
2	දෙල්ලව ඇළ	හප්පිටිය ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිමේදී ගිං ගඟට එකතු වේ.
3	අරණුව දොළ	සිංහරාජ කඳුවැටියෙන් ගලා විත් ලංකගමදී ගිං ගඟට එකතු වේ.
4	රංකැට ඇළ	ඇඹලෙගෙදර උතුර ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගලා ගොස් ගිං ගඟට එකතු වේ.
5	ගිහුම්මඩුව ඇළ	මාවනාන ග්‍රාම නිලධාරී කොටසේ උතුරු මායිමේදී ගිං ගඟට එකතු වේ.
6	ගිහුරුව ඇළ	බෙල්ලවිල කොටසින් ගිං ගඟට එකතු වේ.
7	කොස්මුල්ල ඇළ	කොස්මුල්ල ප්‍රදේශයෙන් ගිං ගඟට එකතු වේ.
8	හැරියාව දොළ	ලංකාගම ප්‍රදේශයෙන් ගිං ගඟට එකතු වේ.
9	ඉන්දල දොළ	ඇඹලේගෙදර හේලිස් විදුලි බලාගාරය අසලින් ගිං ගඟට එකතු වේ.

2.4.5. ඇළ/දොළ

අනු	ඇළ/දොල මාර්ගයේ නම	ග්‍රාම නිලධාරි වසම	පළල (මීටර්)
3.	තඹලගම ඇළ	තඹලගම	4/5
4.	පරගහහේන දොළ	තඹලගම	3/4
5.	දෙනියහේන දොළ	තඹලගම	3/4
6.	හට්ටිගෙදර දොළ	තඹලගම	3/4
7.	වරුකන්දෙණිය දොළ	වරුකන්දෙණිය	2/3
8.	විදානගල් දොළ	වරුකන්දෙණිය	4/5
9.	දොඩම් දොළ	වරුකන්දෙණිය	2/3
10.	ඔරුවකොටු දොළ	වරුකන්දෙණිය	2/3
11.	ප්‍රජාමඩුව දොළ	වරුකන්දෙණිය	2/3
12.	මකුණුපෙත්ත ඇළ	ඇහැලපිටිය	3/4
13.	කටු කැන්දෙ ඇළ	කොස්මුල්ල, මාවිට	3/4
14.	දෙල් කන්ද ඇළ	මාවිට නැගෙනහිර,	3/4
15.	ගිගුරුව ඇළ	කොස්මුල්ල, බටහිර	4/5
16.	හල්දොල	පහළ මිල්ලව	3/4
17.	වැකඩ ඇළ	දේවාලෙගම නැ	3/4
18.	එරබද්දෙවෙල මහ දොළ	ඉහළ මිල්ලව	3/4
19.	දෙනියාවේ දොළ	දේවාලේගම	3/4
20.	ඉහළ කොස්මුල්ල ඇළ	කොස්මුල්ල	3/4
21.	පහළ කොස්මුල්ල ඇළ	කොස්මුල්ල	3/4
22.	ගැටනායක දොළ	දෙල්ලව	3/4
21.	මිල්ලව ඇළ	ඉහළ මිල්ලව, පහළ	3/4
22.	හොරිය දොළ	ඉහළ මිල්ලව, පහළ	3/4
23.	බටහිර ගොඩ දොළ	ඉහළ මිල්ලව, පහළ	3/4
24.	ඌරුවන් දොළ	ඉහළ මිල්ලව, පහළ	3/4
25.	ගැටනායක දොළ	දෙල්ලව	3/4
26.	ආඳා දොළ	දෙල්ලව	4/5
27.	පාලේකන්ද දොළ	දෙල්ලව	3
28.	හීන් දොළ	දෙල්ලව	3
29.	තුම්බබේරිය ඇළ	දෙල්ලව	3/4
30.	මහ දොළ	ලංකාගම	6/8
31.	පාඩි දොළ	ලංකාගම	3/4
32.	පරගහහේන දොළ	ලංකාගම	3/4
33.	තියඹරහේන දොළ	ලංකාගම	3/4
34.	පුස්වෙල් දොළ	ලංකාගම	3/4
35.	හීන් දොළ	බටහිර මිල්ල්ලව	3/4
36.	නවදි ඇළ	මද්දෙගම නැ	3/4
37.	වන්නි කන්ද ඇළ	බටුවංගල	3/4
38.	පීල්ල ඇළ	බටුවංගල	3/4
39.	ගල්පොතු කැටිය ඇළ	හප්පිටිය	3/4

40.	කටුකිතුල්හේන ඇළ	හප්පිටිය	3/4
41.	අතුරේගෙදර දොළ	ඉහළ මිල්ලව	3/4
42.	තුන්දොළ	ඉහළ මිල්ලව	3/4
43.	දෙල්ලව ඇළ	දේවාලේගම	8/10
44.	කන්දෙහේන දොළ	හත්පිටිය,	3/4
45.	ලේල්වල මහ දොළ	පහළ ලේල්වල	3/4
46.	ගල්වින්න දොළ	පහළ ලේල්වල	3/4
47.	පත්තරාහේන ඇළ	පහළ ලේල්වල	3/4
48.	කැකිරිහේන දොළ	ඉහළ ලේල්වල	3/4
49.	ඕකන්ද හේන දොළ	ඉහළ ලේල්වල	3/4
50.	වාඩිමුල්ල ඇළ	පන්නිමුල්ල	3/4
51.	රිලාහේන ඇළ	පන්නිමුල්ල	3/4
52.	අඹගහහේන දොළ	පන්නිමුල්ල	3/4
53.	හිරිකැටි ඇළ	පන්නිමුල්ල	3/4
54.	ගල්පොතු කැටිය දොළ	පන්නිමුල්ල	3/4
55.	කෙහෙල් වරාවේ දොළ	පනාගොඩ	2/3
56.	පාන්තිය ගොඩ ඇළ	පනාගොඩ	2/3
57.	හීන් ඇළ	පනාගොඩ	2/3
58.	හල්ලින්න ඇළ	මියනවතුර	2/3
59.	නැකති ඇළ	මියනවතුර	2/3
60.	පල්ලෙකුඹුර ඇළ	මියනවතුර	2/3
61.	ඉම්මේ ඇළ	මාවිට බටහිර	3/4
62.	දෙලංකාවේ ඇළ	මාවිට බටහිර, මාවිට	3/4
63.	කැන්දකැටිය හේන දොළ	මාවිට බටහිර	3/4
64.	තල්පාදි ඇළ	මාවිට බටහිර	3/4
65.	දෙගල්ලකන්ද ඇළ	මාවිට බටහිර	3/4
66.	රන්කැට ඇළ	මාවිට බටහිර	3/4
67.	පුවක්ගහ ඇළ	මාවිට බටහිර	3/4
68.	දෙගල්ලකන්ද ඇළ	මාවිට නැගෙනහිර	3/4
69.	හොරකන්තැලියහේන දොළ	බටහිර බටුවන්ගල	2/3
70.	දෙල්ගස් ඇළ	මැදගම	3
71.	මග හේන ඇළ	නෙළුව	3/4
72.	පරාලියද්ද ඇළ	නෙළුව	3/4
73.	දෝරාව ඇළ	නෙළුව	3/4
74.	බානාව ඇළ	පහළ ගිහුම්මඩුව	3/4
75.	කළු ඇළ	ඉහළ ගිහුම්මඩුව	3/4
76.	ඇල්ලේ දොළ	දනවල	3/4
77.	ඉකික දොළ	ඇඹලේගෙදර උතුර	3/4
78.	පත්තරහේන දොළ	ඇඹලේගෙදර උතුර	3/4
79.	උඩුමුල්ල ඇළ	ඇඹලේගෙදර උතුර	3/4

2.5.1. බෑවුම් කළාප

බෑවුම් කලාප සිතියම සකස් කරනු ලබන්නේ භූ ලක්ෂණ සිතියම් ඇසුරින් සහ එහි සමෝච්ච රේඛා පරතරය සැළකිල්ලට ගනිමිනි) .රක්වාන ,මොරවක හා අළුත්ගම අඟලේ සිතියම් ඇසුරිනි (ඒ අනුව ප්‍රධාන බෑවුම් කලාප 5කට බෙදේ. එනම්,

1. 0–% 8
2. 8–% 16
3. 16–% 30
4. 30–% 60
5. 60ට වැඩි ආදී වශයෙනි.

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උන්නතාංශයෙන් යුතු කඳුකර ප්‍රදේශයකි .මද්දෙගම , මද්දෙගම ඉහළ ,මාවනාන,ලේල්වල ,කොස්වත්ත යන ග්‍රාම නිලධාරී වසම්වල සමහර කොටස් 8 % බෑවුම් කලාපයට අයත් වේ.


මාවිට ,ඇඹලෙගෙදර ,බටුවංගල ,කොස්මුල්ල ,වාරුකන්දෙණිය ,හප්පිටිය ,ලංකාගම ,පන්නිමුල්ල , මියනවතුර ,දෙල්ලව ,මිල්ලව ඉහළ, පහළ සහ බටහිර යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල %60ට වැඩි බෑවුම් ප්‍රදේශ දක්නට ලැබේ .

මේ හැරුණුවිට තැනින් තැන එනම් මැණිකාවිට ,තිබ්බටුවාවකන්ද ,කළුබෝවිටියන ,මාවිට කඳුවැටි මුදුන්වල සීමා බෑවුම් සහිත ගල්තලා දක්නට ලැබේ.

ඒ අනුව නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප සහ ඒ ඒ බෑවුම් කලාප යටතේ ඇති බිම් ප්‍රමාණයන් මෙසේ දැක්විය හැකිය.

අනු අංකය	බෑවුම් කලාපය	බිම් ප්‍රමාණ(හෙක්ටයාර්)
1	0–% 8	78 .5108
2	8–% 16	22 .1621
3	16–% 30	76 .4935
4	30–% 60	.180545
5	60ට වැඩි	91 .1686
6	ගල්තලා	64 .190

2.5.2. බෑවුම් කළාප දැක්වෙන සිතියම



බෑවුම් කළාප දැක්වෙන සිතියම

සිතියම් අංක 2.3

2.6.1. භූවිද්‍යාත්මක තත්වය

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විද්‍යාත්මක තොරතුරු පිළිබඳව විමසා බැලීමේ දී ප්‍රාග් ක්‍රේම්බ්‍රිය යුගයට අයත් පාෂාණවලින් නිර්මාණය වී ඇත .විශේෂයෙන් ම මෙම ප්‍රදේශයේ විජයානු ශ්‍රේණියට ගැනෙන චානෝකයිට් හා මෙටා අවසාදිත පාෂාණයන්ගෙන් සමන්විතය.

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ චානෝකයිට් හෙක්ටයාර 7, 256ප්‍රමාණයක් ද මෙටා අවසාදිත හෙක්ටයාර 8,092 ක ප්‍රමාණයක් ද දක්නට ඇත.


2.6.2. පාංශු තත්ත්වය

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ රතු ,කහ පොඩිසෝලික් යන පස් වර්ගය ය. මෙම කොට්ඨාසයේ පාංශු ව්‍යාප්තිය හා බිම් ප්‍රමාණය හෙක්ටයාර වලින් පහත පරිදි දැක්විය හැකිය.

සංකේතය	පාංශු වර්ගය	බිම්ප්‍රමාණය (හෙක්ටයාර)
01 C1	වර්ණක සහිත රතු කහ පොඩිසෝලික් පස හා රතු කහ පොඩිසෝලික් පස	11,060
02 C2	වර්ණක සහිත රතු කහ පොඩිසෝලික් පස කැපී පෙනෙන ඒ තට්ටුව සහිත රතු කහ පොඩිසෝලික් පස	3,829
03 LR	ලිතසෝල් සහ බෑවුම් ගල් තලා	460

පාංශු කලාප

2.6.3. පාංශු කලාප දැක්වෙන සිතියම



2.7. කෘෂි පාරිසරික කළාප

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෙත් කලාපයට අයත් වන අතර ,උන්නතාංශය ,පස හා වර්ෂාපතනය පදනම් කර ගනිමින් WL, WM යනුවෙන් නැවතත් කෘෂි පාරිසරික කලාප වලට බෙදේ . WL 1 කලාපය, මීටර් 300අඩු පහත රට තෙත් කලාපය වන අතර අවුරුද්දේ වැඩි කාලයක් වර්ෂාපතනය ලැබීමේ සම්භාවිතාවයක් පවතී. මෙම කලාපයේ අපේක්ෂිත වර්ෂාපතන සඵලතාවය මිලි මීටර් 2, 540කි .මෙහි රතු ,කහ පොඩිසෝලික් පස දක්නට ලැබේ.

WM 1 කලාපය මීටර් 800ට අඩු මැදරට තෙත් කලාපයයි .මෙම කලාපයේ අපේක්ෂිත වර්ෂාපතනය මිලි මීටර් 3175ට වැඩි වේ .මෙම කලාපය ශ්‍රී ලංකාවේ නිරිත දිග තෙත් කලාපයට අයත්වන අතර , උෂ්ණ ආර්ද්‍ර දේශගුණයක් පවතී .සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙන්ට්‍රිග්‍රේට් 26.8 ක් වන අතර දෛනික උෂ්ණත්ව අන්තරය ද එතරම් විශාල නැත.


නෙළුව කොට්ඨාසය අනෙක් කොට්ඨාසවලට වඩා උන්නතාංශයකින් පිහිටීම නිසා වැඩි වර්ෂාපතනයක් ලබන අතර ,මැයි මස සිට සැප්තැම්බර් මාසය දක්වා නිරිත දිග මෝසම් සුළඟින් වැඩිම වර්ෂාපතනයක් ලබයි. එමෙන් ම ඊසාන දිග මෝසම් ,අන්තර් මෝසම් පවතින කාලවල දී වාසුළි සහ අවපාත හේතු කරගෙන වර්ෂාපතනයක් ලබයි .

2.8.1. වසම් අනුව ජනගහනය - (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ)

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	පුද්ගලයින් සංඛ්‍යාව			අවු 18 : අඩු		අවු 18 : වැඩි	
			පුරුෂ	ස්ත්‍රී	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ
1	නෙළුව	1207	595	612	145	149	467	446
2	මාවිට/නැ	1127	566	561	144	144	417	422
3	බටුවංගල	887	455	432	123	126	309	329
4	මාවනාන	1147	598	549	123	154	426	444
5	ඇඹලෙගෙදර /උ	979	475	504	78	77	426	398
6	හප්පිටිය	1480	735	745	195	175	550	560
7	වාරුකන්දෙණිය	716	356	360	80	89	280	267
8	පනාගොඩ	1063	521	542	133	132	409	389
9	පන්නිමුල්ල	857	424	433	92	93	341	331
10	ප/මද්දේගම	634	308	326	76	78	250	230
11	මද්දෙගම/නැ	614	299	315	65	54	250	245
12	කොස්මුල්ල	575	290	285	73	58	212	232
13	බටහිරබටුවංගල	912	452	460	115	103	345	349
14	ඇහැලපිටිය	732	364	368	96	89	272	275
15	දේවාලේගම/නැ	1257	641	616	135	152	481	489
16	ප/මිල්ලව	1421	747	674	201	227	473	520
17	මියනවතුර	601	301	300	80	78	220	223
18	දෙල්ලව	570	277	293	81	70	212	207
19	තඹලගම	230	121	109	29	38	800	83
20	ඉහළගිහුම්මඩුව	2594	1276	1318	345	340	973	936
21	ලංකාගම	676	341	335	87	91	248	250
22	පහළගිහුම්මඩුව	1032	510	522	124	129	398	381
23	මාදුගැට	316	154	162	39	39	123	115
24	කොස්වත්ත	575	268	307	67	63	240	205
25	බටහිරමිල්ලව	566	290	276	68	72	208	218
26	ඉ/මිල්ලව	764	363	401	89	81	312	282
27	දනවල	1241	604	637	171	160	466	444
28	පහළලේල්වල	691	340	351	91	93	260	247
29	මාවිටබටහිර	888	459	429	127	136	302	323
30	ඉහළමද්දේගම	703	372	331	62	78	269	294
31	දේවාලේගම/බ	646	331	315	75	92	240	239
32	ඉහළලේල්වල	1012	491	521	158	158	363	333

33	මැදගම	1477	725	752	225	217	527	508
34	ඇඹලෙගෙදර/ද	551	284	267	62	76	205	208
එකතුව		**30741**	**15333**	**15408**	**3854**	**3911**	**11554**	**11422**

2.8.2. වසම් අනුව ජනගහන ප්‍රස්ථාරය



2.9.1. ජන ව්‍යාප්තිය (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ)

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	පවුල් සංඛ්‍යාව	ස්ත්‍රී	පුරුෂ	එකතුව
1	නෙළුව	372	612	595	1207
2	මාවිට නැගෙනහිර	342	561	566	1127
3	බටුවංගල	260	432	455	887
4	මාවනාන	331	549	598	1147
5	ඇඹලෙගෙදර උතුර	317	504	475	979
6	හප්පිටිය	383	745	735	1480
7	වාරුකන්දෙණිය	213	360	356	716
8	පනාගොඩ	299	542	521	1063
9	පන්නිමුල්ල	266	433	424	857
10	පහළ මද්දේගම	195	326	308	634
11	නැගෙනහිර මද්දේගම	209	315	299	614
12	කොස්මුල්ල	152	285	290	575
13	බටහිර බටුවංගල	267	460	452	912
14	ඇහැලපිටිය	215	368	364	732
15	දේවාලේගම නැගෙනහිර	397	616	641	1257
16	පහළ මිල්ලව	430	674	747	1421
17	මියනවතුර	174	300	301	601
18	දෙල්ලව	181	293	277	570
19	තඹලගම	60	109	121	230
20	ඉහළ ගිහුම්මඩුව	525	1318	1276	2594
21	ලංකගම	190	335	341	676
22	පහළගිහුම්මඩුව	257	522	510	1032
23	මාදුගැට	86	162	154	316
24	කොස්වත්ත	180	307	268	575
25	බටහිර මිල්ලව	170	276	290	566
26	ඉහළ මිල්ලව	228	401	363	764
27	දනවල	363	637	604	1241
28	පහළ ලේල්වල	194	351	340	691
29	මාවිට බටහිර	251	429	459	888
30	ඉහළ මද්දෙගම	214	331	372	703

31	දේවාලේගම බටහිර	167	315	331	646
32	ඉහළලේල්වල	306	521	491	1012
33	මැදගම	430	752	725	1477
34	ඇඹලෙගෙදර දකුණ	189	267	284	551
		8813	**15408**	**15333**	**30741**


2.9.2. ජන ව්‍යාප්තිය ප්‍රස්ථාරය

2.10.1. පවුල් සංඛ්‍යාව හා නිවාස තොරතුරු (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ)

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	මුළු නිවාස සංඛ්‍යාව	ස්ථීර නිවාස	අර්ධ ස්ථීර නිවාස	තාවකාලික නිවාස	වතු නිවාස	රජයේ නිල නිවාස	බදු නිවාස	නිවාස නොමැති
1	නෙළුව	378	360	1	-	-	11	7	-
2	මාවිට/නැ	335	266	65	2	-	-	-	**2**
3	බටුවංගල	252	246	4	2	-	-	-	-
4	මාවනාන	318	290	18	10	-	-	-	-
5	ඇඹලෙගෙදර/උ	322	288	23	4	7	-	-	**4**
6	හප්පිටිය	374	367	4	2	1	-	-	**7**
7	වාරුකන්දෙණිය	200	163	26	11	-	-	-	**3**
8	පනාගොඩ	268	232	20	6	10-	-	-	**2**
9	පන්නිමුල්ල	264	259	-	5	-	-	-	**2**
10	පහළ මද්දේගම	190	169	19	2	-	-	-	**5**
11	මද්දෙගම/නැ	201	189	5	3	7	-	-	**14**
12	කොස්මුල්ල	156	139	10	1	-	-	-	**2**
13	බ/බටුවංගල	251	250	1	-	-	-	-	-
14	ඇහැලපිටිය	204	186	16	2	-	-	-	**1**
15	දේවාලේගම/නැ	389	318	40	9	22	-	-	-
16	පහළ මිල්ලව	408	353	26	22	7	-	-	**1**
17	මියනවතුර	165	150	5	10	-	-	-	**3**
18	දෙල්ලව	161	121	5	8	27	-	-	-
19	තඹලගම	57	56	1	-	-	-	-	**2**
20	ඉ/ගිහුම්මඩුව	507	413	80	14	-	-	-	**3**
21	ලංකගම	183	95	81	7	-	-	-	**7**
22	ප/ගිහුම්මඩුව	274	235	72	3	-	2	2	**1**
23	මාදුගැට	79	71	5	3	-	-	-	-
24	කොස්වත්ත	166	158	7	1	-	-	-	**1**
25	බටහිර මිල්ලව	160	118	32	10	-	-	-	-

26	ඉ හළ මිල්ලව	207	182	14	8	3	-	-	-
27	දනවල	363	333	25	2	-	3	-	-
28	පහළ ලේල්වල	186	178	4	4	-	-	-	**1**
29	මාවිට/බ	247	93	143	11	-	-	-	**4**
30	ඉ/මද්දෙගම	204	173	25	6	-	-	-	**4**
31	දේවාලේගම/බ	162	136	23	3	-	-	-	**2**
32	ඉ/ලේල්වල	308	287	14	8	42	-	-	**17**
33	මැදගම	424	387	30	4	-	-	-	**2**
34	ඇඹලෙගෙදර/ද	155	143	6	3	2	1	-	-
එකතුව		**8451**	**7305**	**820**	**183**	**107**	**15**	**07**	61

.10.2. පවුල් සංඛ්‍යාව හා නිවාස [illegible]




2.11.1. ජල සම්පාදනය පිළිබඳ තොරතුරු - (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ

අනු අංකය	ග්‍රාම නිලධාරී	නිවාසසංඛ්‍යාව	නළ ජලය	ආරක්ෂිත ළිං	අනාරක්ෂිත ළිං	අනෙකුත්	ග්‍රාමීය ජල ව්‍යාපෘති	නළ ළිඳ
1	නෙළුව	378	342	29	7	-	-	-
2	මාවිට/නැ	335	318	8	9	-	-	-
3	බටුවංගල	252	222	30	-	-	-	-
4	මාවනාන	318	134	169	15	-	-	-
5	ඇඹලෙගෙදර/උ	311	155	16	140	-	-	-
6	හප්පිටිය	374	337	4	3	30	-	-
7	වාරුකන්දෙණිය	200	160	-	-	-	40	-
8	පනාගොඩ	268	238	5	4	21	-	-
9	පන්නිමුල්ල	264	258	6	-	-	-	-
10	ප/මද්දේගම	190	151	15	20	4	-	-
11	මද්දෙගම/නැ	196	171	25	-	-	-	-
12	කොස්මුල්ල	150	150	-	-	-	-	-
13	බ/බටුවංගල	251	251	-	-	-	-	-
14	ඇහැලපිටිය	204	198	6	-	-	-	-
15	දේවාලේගම/නැ	389	370	13	-	6	-	-
16	ප/මිල්ලව	408	368	5	2	33	-	-
17	මියනවතුර	165	147	10	6	2	-	-
18	දෙල්ලව	161	153	8	-	-	-	-
19	තඹලගම	57	31	-	-	-	26	-
20	ඉ/ගිහුම්මඬුව	507	337	13	37	120	-	-
21	ලංකගම	183	183	-	-	-	-	-
22	ප/ගිහුම්මඬුව	254	180	11	63	-	-	-
23	මාදුගැට	79	70	-	-	9	-	-
24	කොස්වත්ත	166	166	-	-	-	-	
25	බ/මිල්ලව	160	152	8	-	-	-	-
26	ඉ/මිල්ලව	207	138	32	2	35	-	-
27	දනවල	363	299	7	52	5	-	-
28	ප/ලේල්වල	186	109	69	7	1	-	-
29	මාවිට/බ	247	69	14	157	7	-	-
30	ඉ/මද්දෙගම	204	119	76	9	-	-	-
31	ඉ/ලේල්වල	283	240	25	18	-	-	-
32	දේවාලේගම/බ	162	162	-	-	-	-	-
33	මැදගම	424	403	11	10	-	-	-

34	ඇඹලෙගෙදර/ද	155	87	-	65	3	-	-
එකතුව		**8451**	**6868**	**615**	**626**	**276**	**66**	**-**

2.11.2. ජල සම්පාදන තොරතුරුපිළිබඳ ප්‍රස්ථාරය



2.12. වසම් අනුව පොදු ගොඩනැඟිලි (මූලාශ්‍රය -සම්පත් පැතිකඩ)

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	ආගමික ස්ථාන	පාසල්	පාසල් (ද්විතීයික)	පෙර පාසල්	දහම් පාසල්	පුස්තකාල	සේවා පියස	ප්‍රජාශාලා	ක්‍රීඩා පිටි
1	නෙළුව	1	-	1	3	1	4	-	-	**2**
2	මාවිට	-	1	-	-	-	-	-	**2**	**1**
3	බටුවංගල	2	-	2	-	2	-	1	**1**	**2**
4	මාවනාන	1	1	-	-	1	-	-	-	**1**
5	ඇඹලෙගෙදර	1	-	-	-	1	-	-	**1**	-
6	හප්පිටිය	1	-	-	1	-	-	-	**3**	-
7	වාරුකන්දෙණිය	2	1	-	-	1	-	-	**2**	**2**
8	පනාගොඩ	1	-	1	1	1	-	-	**3**	**1**
9	පන්නිමුල්ල	-	-	-	-	-	-	-	-	-
10	පහළ මද්දේගම	-	-	-	-	-	-	-	**1**	**1**
11	මද්දෙගම	1	-	-	-	-	-	-	-	-
12	කොස්මුල්ල	-	-	-	-	-	-	-	-	-
13	බ/බටුවංගල	-	1	-	-	1	-	-	**2**	**1**
14	ඇහැලපිටිය	-	-	-	1	1	-	-	**2**	-
15	දේවාලේගම	2	1	1	1	2	1	4	**1**	**1**
16	පහළ මිල්ලව	1	1	-	1	1	-	1	-	-
17	මියනවතුර	1	-	-	-	1	-	-	**1**	**1**
18	දෙල්ලව	1	-	-	-	-	-	-	**1**	**1**
19	තඹලගම	1	-	-	-	-	-	-	-	-
20	ඉහළ	2	1	-	1	1	-	-	**4**	-
21	ලංකගම	2	-	1	1	1	-	1	**3**	**1**
22	පහළ	-	-	-	1	-	-	1	**4**	**1**
23	මැදගම	2	1	-	1	1	-	-	**3**	-
24	කොස්වත්ත	1	-	-	1	-	-	-	-	-
25	බටහිර මිල්ලව	1	-	-	1	-	-	-	**1**	**1**
26	ඉහළ මිල්ලව	-	-	-	-	-	-	1	**1**	**1**
27	දනවල	2	-	-	1	1	-	-	**2**	-
28	ප/ලේල්වල	2	1	-	1	2	-	1	**2**	**1**
29	මාවිට බටහිර	2	-	-	1	1	-	-	**1**	**1**
30	ඉහළ මද්දෙගම	1	-	-	-	-	-	-	-	-
31	දේවාලේගම	2	1	-	1	1	-	-	**1**	-
32	ඉහළ ලේල්වල	2	-	-	1	1	-	-	**1**	-

33	මාදුගැට	1	-	-	-		1	-	**1**	-
34	ඇඹලෙගෙදර	-	-	-	1	-	-	1	**1**	-
එකතුව		**36**	**10**	**6**	**20**	**22**	**6**	**11**	**45**	

2.13. නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල් ලේඛනය

අනු අංකය	පාසල	ග්‍රාම නිලධාරීවසම	දුරකථන අංකය
1	ගා/නෙළුව ජාතික පාසල	නෙළුව	091-3905369
2	ගා/ කඩිහිංගල කනිෂ්ඨවිද්‍යාලය	පනාගොඩ	071-6071532
3	ගා/ දෙල්ලව මහාවිද්‍යාලය	දේවාලේගම නැගෙනහිර	070-1213931
4	ගා/ මාවනාන කණිෂ්ඨවිද්‍යාලය	මාවනාන	071-4797220
5	ගා/ මිල්ලව කණිෂ්ඨවිද්‍යාලය	පහළ මිල්ලව	071-3218121
6	ගා/ලේල්වල ගිහුම්මඩුවකණිෂ්ඨ විද්‍යාලය	ඉහළ ගිහුම්මඩුව	071-5817626
7	ගා/ ඉහළ ලේල්වල කණිෂ්ඨවිද්‍යාලය	පහළ ලේල්වල	071-5659771
8	ගා/ බටහිර බටුවංගල කණිෂ්ඨ විද්‍යාලය	බටහිර බටුවංගල	071-8271236
9	ගා/ හප්පිටිය කණිෂ්ඨවිද්‍යාලය	හප්පිටිය	071-8134039
10	ගා/ වාරුකන්දෙණියකණිෂ්ඨ විද්‍යාලය	වාරුකන්දෙණිය	071-9537037
11	ගා/ ලංකාගම මහා විද්‍යාලය	ලංකාගම	071-5737927
12	ගා/ මාවිට ආදර්ශවිද්‍යාලය	මාවිට නැගෙනහිර	071-2546113
13	ගා/ දේවාලේගම කණිෂ්ඨවිද්‍යාලය	දේවාලේගම බටහිර	
14	ගා/ මැදගම ආදර්ශවිද්‍යාලය	මැදගම	071-8425622
15	ගා/ බටුවංගල මහාවිද්‍යාලය	බටුවංගල	071-5661862

2.14. ආගමික ස්ථාන පිළිබඳ ලේඛනය

අනු අංකය	විහාරස්ථානයේ/ආරණ්‍යසේනාසනයේ/සිල්මාතා ආරාමයේ නම	ලිපිනය	දුරකථන අංකය
1	ශ්‍රීනාථාරාමය	දෙල්ලව,මොරවක	**091-3783691**
2	ශ්‍රී ගුණානන්ද බෞද්ධ මධ්‍යස්ථානය	කඩිහිංගල,පන්නිමුල්ල,පනාගොඩ,නෙළුව	**091-3789117**

3	ශ්‍රී අබේසිංහාරාමය	වාරුකන්දෙණිය,නෙළුව.	071-1148169
4	ශ්‍රී සුදර්ශනාරාමය	මාවිට,කොස්වත්ත,නෙළුව	091-3783432
5	සිංහලෙන තපෝවනය	කොස්මුල්ල,නෙළුව	091-3936585
6	ශ්‍රී සම්බෝධි තපෝවනය	පිංකන්දහේන,දනවල,නෙළුව	071-3563533
7	ශ්‍රී මෙත්තාරාමය	බ/මිල්ලව,මොරවක	091-3414722
8	අහරගල ආරණ්‍ය සේනාසනය	අහරගල	091-3902385
9	ශ්‍රී විජයාරාමය	ලේල්වල,නෙළුව	071-9090031
10	ධර්මපාල විහාරය	උඩුගම පාර ,නෙළුව	071-3074120
11	ශ්‍රී සුගත බිම්බාරාමය	දනවල,තිනියාවල,නෙළුව	091-3915095
12	ශ්‍රී ඛෙත්තාරාමය	මියනවතුර,දෙල්ලව,මොරවක	091-5723502
13	ශ්‍රී සුගත විහාරය	දේවාලේගම, දෙල්ලව,මොරවක	071-8062199
14	ශ්‍රී මුනිනන්දනාරාමය	මැණිකාවිට,හප්පිටිය,නෙළුව	071-2040975
15	ශ්‍රී සුමේධාරාමය	මැදගම,නෙළුව	091-3900465
16	ශ්‍රී රේවතාරාම පූරාණවිහාරය	මාවනාන,නෙළුව	091-3129420
17	සුබෝධි සෝමසාර විහාරය	සෝමසාර මාවත,ඇඹලෙගෙදර,නෙළුව	071-2428778
18	ධර්මරාජ විහාරය	පොල්ගම්පල,දෙල්ලව, මොරවක	071-4647620
19	ශ්‍රී ජයන්තාරාමය	මාදුගැට,නෙළුව	091-2237415
20	ශ්‍රී මෛත්‍රී විහාරය	තඹලගම,නෙළුව	091-3912420
21	ශ්‍රී මහා විහාරය	ඉ/ලේල්වල,නෙළුව	071-4296730
22	ශ්‍රී ගංගාරාමය	ලංකාගම,දෙනියාය	091-5737908
23	සංඝමිත්තා ථේරිකාරාමය	ම/නැගෙනහිර,බටුවංගල,නෙළුව.	071-7093380
24	කිරළකන්ද මෙහෙණි ආරාමය	කොස්මුල්ල,නෙළුව.	
25	සංඝමිත්තා මෙහෙණිආරාමය	කොස්වත්ත,නෙළුව	091-4917275
26	අරියශීල ආරාමය	කැවුම්කුඹුර,සුදුවැල්ලෑව,මාවනාන,නෙ	091-3927258
27	පුරාණ රජමහා විහාරය බටුවංගල	බටුවංගල,නෙළුව	071-5975671
28	ධර්මාලෝක ධර්මායතනය	ඉලුක්කැටිය, බටුවංගල,නෙළුව	091-3248017
29	ශ්‍රී ඥාණාලෝක විහාරය	බානාව පාර,පිටකන්ද,නෙළුව.	071-1148169
30	ශ්‍රී මදරසිංහාරාමය	කුකුල් කන්ද,සුදුවැලිපත,නෙළුව	071-3074120
31	ධර්මාලෝක විහාරය	මොරගහකන්ද,උඩවෙල පාර,නෙළුව	071-8376342
32	බෝධිමළු විහාරය	කැකිරිහේන,ඉ/ලේල්වල,නෙළුව.	091-3784092
33	ගංගාගිරි විහාරය	වතුගල,දෙනියාය	071-3948585
34	ශ්‍රී සුදර්ශනාරාමවිහාරස්ථානය	පහල මිල්ලව,මොරවක	071-1148169
35	උළුවහුගල ආරණ්‍යසේනාසනය	මාවිට බටහිර,නෙළුව	
36	ජාත්‍යන්තර බෞද්ධමධ්‍යස්ථානය	මොරවිටිගල,දනවල,නෙළුව	
37	පූජ්‍යගල්ලෙන් සේනාසනය	දේවාලේගම,දෙල්ලව,මොරවක	



තුන්වන පරිච්ඡේදය.

03. පූර්ව ආපදා තොරතුරු විශ්ලේශණය

3.1. වර්ෂය අනුව සිදුවූ ආපදාව

අ අං	වසමේ නම	ආපදාව								
		2017	2018	2019	2020	2021	2022	2023	2024	2025
1	නෙළුව	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්
2	මාවිටනැගෙනහිර	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්
3	බටුවංගල	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්
4	මාවනාන	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්
5	ඇඹලෙගෙදරඋතුර	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්
6	හප්පිටිය	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්
7	වාරුකන්දෙණිය	නායයෑම	කන්ඩකඩාවැටීම්	කන්ඩිකඩාවැටීම්	කන්ඩිකඩාවැටීම්	නායයෑම	කන්ඩකඩාවැටීම්	කන්ඩිකඩාවැටීම්	කන්ඩිකඩාවැටීම්	කන්ඩිකඩාවැටීම්
8	පනාගොඩ	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්	සුළුගංවතුර කන්ඩකඩාවැටීම්

9	පන්නිමුල්ල	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
10	පහල මද්දේගම	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
11	මද්දේගම නැගෙනහිර	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
12	කොස්මුල්ල	මහාගංවතුර හානායයෑම්	අකුණුසුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	නැත	නැත	මහාගංවතුර හානායයෑම්	නැත	නැත	නැත	නැත
13	බ/බටුවංගල	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
14	ඇහැළපිටිය	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
15	දේවාලේගමනැගෙනහිර	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
16	පහල මිල්ලව	නායයෑම	නැත	නැත	නැත	නායයෑම	නැත	නැත	නැත	නැත
17	මියනවතුර	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්

18	දෙල්ලව	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
19	තඹලගම	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
20	ඉහලගිගුම්මඩුව	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
21	ලංකගම	මහාගංවතුර හානායයෑම්	වල්අලි	වල්අලි	වල්අලි	මහාගංවතුර හානායයෑම්	වල්අලි	වල්අලි	වල්අලි	වල්අලි
22	පහලගිගුම්මඩුව	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	මහාගංවතුර හානායයෑම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්
23	මාදුගැට	මහාගංවතුර හානායයෑම්	නැත	නැත	නැත	මහාගංවතුර හානායයෑම්	නැත	නැත	නැත	නැත
24	කොස්වත්ත	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	නැත	නැත	නැත	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	නැත	නැත	නැත	නැත
25	බටහිරමිල්ලව	නායයෑම	නැත	නැත	නැත	නායයෑම	නැත	නැත	නැත	නැත
26	ඉහළමිල්ලව	සුළුගංවතුර නායයෑම්	නැත	නැත	නැත	සුළුගංවතුර නායයෑම්	නැත	නැත	නැත	නැත
27	දනවල	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩ කඩා වැටීම්


28	පහළ ලේල්වල	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
29	මාවට බටහිර	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	කන්ඩි කඩා වැටීම්	කන්ඩික ඩා වැටීම්	කන්ඩික ඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	කන්ඩි කඩා වැටීම්	කන්ඩික ඩා වැටීම්	කන්ඩික ඩා වැටීම්	කන්ඩික ඩා වැටීම්
30	ඉහළ මද්දෙගම	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්	සුළුගංවතුර කන්ඩි කඩා වැටීම්
31	දේවාලේගම බටහිර	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
32	ඉහල ලේල්වල	නැත	නැත	නැත	නැත	කන්ඩික ඩා වැටීම්	නැත	නැත	නැත	නැත
33	මැදගම	නැත	නැත	නැත	නැත	කන්ඩික ඩා වැටීම්	නැත	නැත	නැත	නැත
34	ඇඹලෙගෙදර දකුණ	නැත	නැත	නැත	නැත	කන්ඩික ඩා වැටීම්	නැත	නැත	නැත	නැත

3.2.1. ගංවතුර හා නායයෑම් හේතුවෙන් අර්ධ හානි ලැබූ පවුල් සංඛ්‍යාව

අනු අංකය	වසමේ නම	බලපෑමට ලක්වූ පවුල් සංඛ්‍යාව								
		2003	2014	2015	2016	2017	2018	2019	2020	2021
1	නෙළුව	121	12	13	7	252	1	-	-	-
2	මාවිටනැගෙනහිර	-	-	-	-	128	-	-	-	2
3	බටුවංගල	81	-	-	-	93	-	1	3	6
4	මාවනාන	-	-	-	-	86	-	-	-	-
5	ඇඹලෙගෙදරඋතුර	-	-	-	-	70	-	-	-	1
6	හප්පිටිය	92	-	-	-	61	-	-	3	2
7	වාරුකන්දෙණිය	-	-	-	-	2	-	-	1	
8	පනාගොඩ	16	-	-	-	49	-	-	2	12
9	පන්නිමුල්ල	200	-	-	-	36	-	-	4	3

10	පහලමද්දේගම		-	-	-	36		1	2	1
11	මද්දේගම නැගෙනහිර	20	20	5	-	29	-	-	-	-
12	කොස්මුල්ල	44	1	-	-	27	-	-	-	2
13	බ/බටුවංගල	95	-	-	-	26	-	-	-	2
14	ඇහැළපිටිය	-	20	-	-	23	-	-	-	
15	දේවාලේගමනැගෙනහිර	-	4	-	-	23	-	1	-	1
16	පහල මිල්ලව	-	-	-	-	21	-	-	-	
17	මියනවතුර	-	-	-	-	17	-	-	-	2
18	දෙල්ලව	-	-	-	-	19	-	-	-	5
19	තඹලගම	12	-	-	-	18	-	-	-	-
20	ඉහලගිගුම්මඩුව		-	-	-	18	-	-	1	4
21	ලංකගම	171	-	-	-	16	-	-	1	2
22	පහලගිගුම්මඩුව	-	-	-	-	16	-	-	1	-
23	මාදුගැට	-	-	-	-	14	-	-	-	-
24	කොස්වත්ත	15	-	-	-	13	-	-	-	1
25	බටහිරමිල්ලව	-	-	-	-	13	-	-	1	
26	ඉහළ මිල්ලව	-	-	-	-	12	-	-	1	1
27	දනවල	-	-	-	-	11	-	-	1	2
28	පහළලේල්වල	-	-	-	-	3	-	1	1	
29	මාවටබටහිර	10	10	10	-	6	-	-	-	-
30	ඉහළමද්දෙගම	-	-	-	-	5	-	-		1
31	දේවාලේගමබටහිර	-	-	-	-	5	-	-	1	
32	ඉහලලේල්වල	-	-	-	-	4	-	-	-	-
33	මැදගම	-	-	-	-	4	-	1	3	3
34	ඇඹලෙගෙදරදකුණ	-	-	-	-	2	-	-	-	-
	එකතුව	877	67	28	7	1158	1	5	26	54

3.2.2. 2017 වර්ෂයේ අර්ධ හානි වූ නිවාස සංඛ්‍යාව ප්‍රස්ථාරගත කිරීම




3.3.1. ගංවතුර හා නායයෑම හේතුවෙන් පූර්ණ හානි ලැබූ පවුල් සංඛ්‍යාව

අනු අංකය	වසමේ නම	පවුල් සංඛ්‍යාව

1	නෙළුව	0
2	මාවිටනැගෙනහිර	0
3	බටුවංගල	1
4	මාවනාන	2
5	ඇඹලෙගෙදරඋතුර	4
6	හප්පිටිය	0
7	වාරුකන්දෙණිය	22
8	පනාගොඩ	1
9	පන්නිමුල්ල	3
10	පහලමද්දේගම	2
11	මද්දේගම නැගෙනහිර	0
12	කොස්මුල්ල	3
13	බ/බටුවංගල	0
14	ඇහැළපිටිය	4
15	දේවාලේගමනැගෙනහිර	1
16	පහල මිල්ලව	3
17	මියනවතුර	6
18	දෙල්ලව	1
19	තඹලගම	1
20	ඉහලගිගුම්මඩුව	1
21	ලංකගම	0
22	පහලගිගුම්මඩුව	2
23	මාදුගැට	2
24	කොස්වත්ත	0
25	බටහිරමිල්ලව	4
26	ඉහළ මිල්ලව	2
27	දනවල	1
28	පහළලේල්වල	2
29	මාවටබටහිර	0
30	ඉහළමද්දෙගම	0
31	දේවාලේගමබටහිර	0
32	ඉහලලේල්වල	0
33	මැදගම	0
34	ඇඹලෙගෙදරදකුණ	0
එකතුව		

3.3.2. නෙළුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පූර්ණ හානි වූ පවුල් සංඛ්‍යාව ප්‍රස්ථාර ගතකිරීම



3.4. ගංවතුර හා නායයෑම හේතුවෙන් යටිතල පහසුකම් වලට ඇතිවූ බලපෑම

අ අං	වසමේ නම	යටිතල පහසුකම් වලට ඇති වූ බලපෑම									
		2003	2017	2018	2019	2020	2022	2022	2023	2024	2025
1	නෙළුව	විදුලි බලය/මාර්ග විනාශ වීම	විදුලි බලය/මා	-	-	-		-	-	49	01
2	මාවිටනැගෙනහිර	මාර්ග,විදුලිරැහැන් විනාශ වීම	මාර්ග,විදු ලිරැහැන්	-	-	-		-	-	02	05
3	බටුවංගල	මාර්ග,විදුලිරැහැන් විනාශ වීම	මාර්ග,විදු ලිරැහැන්	-	-	-		-	-	03	1
4	මාවනාන	මාර්ගවිනාශ වීම	මාර්ගවිනා ශ වීම	-	-	-		-	-	06	15
5	ඇඹලෙගෙදර උතුර	මාර්ග,විදුලිරැහැන් විනාශ වීම.පාලම්	මාර්ග,විදු ලිරැහැන්	-	-	-		-	-	-	05
6	හජ්පිටිය	මාර්ග,විදුලිරැහැන් විනාශ වීම.පාලම්	මාර්ග,විදු ලිරැහැන්	-	-	-		-	-	-	04
7	වාරුකන්දෙණිය	මාර්ගවිනාශ වීම	මාර්ගවිනා ශ වීම	-	-	-		-	-	-	-
8	පනාගොඩ	විදුලිබලය/මාර්ග විනාශ වීම	විදුලිබලය/ මාර්ග	-	-	-		-	-	-	-1
9	පන්නිමුල්ල	මාර්ගවිනාශ වීම,ළිං හා පාලම් විනාශ වීම	මාර්ගවිනා ශ වීම,ළිං	-	-	-		-	-	-1	
10	පහලමද්දේගම	මාර්ගවිනාශ වීම,නල ජල	මාර්ගවිනා ශ වීම,නල	-	-	-		-	-	-	-
11	මද්දේගම	-	-	-	-	-		-	-	-	-
12	කොස්මුල්ල	විදුලිරැහැන්කැඩී යාම, ජල නල පද්ධතියට	විදුලිරැහැ න්කැඩී	-	-	-		-	-	-	2
13	බ/බටුවංගල	පානීයජල ගැටළු	පානීයජල ගැටළු	-	-	-		-	-	-	-
14	ඇහැළපිටිය	මාර්ගවිනාශ වීම	මාර්ගවිනා ශ වීම	-	-	-		-	-	-	2
15	දේවාලේගම නැගෙනහිර	මාර්ගවිනාශ වීම	මාර්ගවිනා ශ වීම	-	-	-		-	-	-	2
16	පහල මිල්ලව	-	-	-	-	-	-	-	-	-	4
17	මියනවතුර	-	-	-	-	-	-	-	-	-	1
18	දෙල්ලව	-	-	-	-	-	-	-	-	-	-
19	තඹලගම	මාර්ගවිනාශ වීම	මාර්ගවිනා	-	-	-		-	-	-	-
20	ඉහලගිගුම්මඩුව	මාර්ගහා විදුලි රැහැන් විනාශ වීම	මාර්ගහා විදුලි	-	-	-		-	-	-	4
21	ලංකගම	නලජල මාර්ග විනාශ වීම, සියළුම පුවෙශ	නල ජලමාර්ග	-	-	-		-	-	-	-
22	පහලගිගුම්මඩුව	මාර්ගවිනාශ වීම,නල ජල මාර්ග විනාශ වීම	මාර්ගවිනා ශ වීම,නල	-	-	-		-	-	-	3
23	මාදුගැට	මාර්ගවිනාශ වීම,නල ජල	මාර්ගවිනා ශ වීම,නල	-	-	-		-	-	-	-
24	කොස්වත්ත	-	-	-	-	-		-	-	-	-
25	බටහිරමිල්ලව	-	-	-	-	-		-	-	-	-
26	ඉහළ මිල්ලව	-	-	-	-	-		-	-	-	2
27	දනවල	-	-	-	-	-		-	-	-	2
28	පහළලේල්වල	-	-	-	-	-		-	-	-	2
29	මාවටබටහිර	නෙළුවපැලවත්ත ප්‍රධාන මාර්ගය	නෙළුවපැ ලවත්ත	-	-	-		-	-	-	-

30	ඉහළමද්දෙගම	-	-	-	-	-		-	-	-	1
31	දේවාලේගමබ	-	-	-	-	-	-	-	-	-	1
32	ඉහලලේල්වල	-	-	-	-	-	-	-	-	-	1
33	මැදගම	-	-	-	-	-	-	-	-	-	4
34	ඇඹලෙගෙදරද	-	-	-	-	-	-	-	-	-	-

3.5. ගංවතුර හේතුවෙන් බලපෑමට ලක්වූ මාර්ග සහ යටවන අඩි ප්‍රමාණය

අ අං	වසමේ නම	යටවන මාර්ගය	යට වූ අඩි ප්‍රමාණය								
